# 08. රබන් පද වාදනය



# රබන් පද වාදනය

අවුරුදු කාලෙට නිතර ඇහෙන රබන් හඬ සංස්කෘතික අංගයක් ලෙස හැඳින්වීමට පුළුවන. එසේම මංගල උත්සව වලදී මෙන්ම ගම්වල පවත්නා නොයෙක් උත්සව වලදී රබන් පද වාදනය දක්නට ලැබේ.

එනම්

සමාජීය උත්සවවලදී

විනෝදය හා සතුට සඳහා

එය සාමූහික ක්‍රියාවලියකි.

කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉඳගෙන කජු කනවා
ලංසි පැටව් මුහුදු යන්න
නැවක් හදනවා තකදොං
නැවක් හදනවා

තුං තුඹ ගෙඩි තුනයි තුනයි
තිත්ත කැකිරි දෙකයි දෙකයි
තුං තුඹ ගෙඩි තුනට කපං
තිත්ත කැකිරි දෙකට කපං

තුඹ ගැට තුඹ මල්
වැට දිග මදු මල්
කොයින්ද මදු මල්
ඇහින්ද මදු මල්

තෙලෙන් බැද්දත් කොබෙයියා
කිරෙන් බැද්දත් කොබෙයියා
තෙලෙන් බැද්දත් කිරෙන් බැද්දත්
කොබෙයියා බොල කොබෙයියා

පිලවක්කේ කැත්ත දොදොං
පිලවටකර කැත්ත දොදොං
රාං රූං කැත්ත දොදොං
දොදොං දොදොං කැත්ත දොදොං